# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2105/23 - 2019 ජනවාරි මස 09 වැනි බදාදා - 2019.01.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරියේ නීතිය යටතේ සකස් කරන ලද කොළඹ නගර සංවර්ධන සැලැස්ම (සංශෝධන) - 2008 සංශෝධනය කිරීම අනුමත කිරීමේ දැන්වීම**

මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය නීතියේ 8ඊ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2008 (සංශෝධිත) කොළඹ නගර සංවර්ධන සැලැස්මට ඇතුළත් කිරීමට නියමිත යෝජිත සංශෝධනය අනුමත කරන ලද බව කලින් කලට සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි නීතියේ 8උ වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාව වෙත මෙයින් දනුම් දෙමි.

1999 කොළඹ නගර සංවර්ධන සැලැස්ම සංශෝධනය කරමින් හා 2008 (සංශෝධිත) කොළඹ නගර සංවර්ධන සැලැස්මේ 7.18 වගන්තියට අදාළව සිදු කරන ලද සංශෝධන 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8ඌ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මා මෙයින් අනුමත කරමි.

01 පනතේ ප්‍රතිපාදන ආදේශ කරමින් කොළඹ නගර සංවර්ධන සැලැස්මේ (මින්මතු 1999 කොළඹ ප්‍රධාන සංවර්ධන සැලැස්ම හා 2008 (සංශෝධිත) සංවර්ධන සැලැස්ම යනුවෙන් සඳහන් කරන) 7.18 වගන්තිය පහත වාක්‍ය අන්තර්ගත කිරීම මගින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. කොළඹ නගර සංවර්ධන සැලැස්ම (සංශෝධිත) - 2008, 7.18 වන වගන්තිය සංශෝධනය කිරීම.

"කොළඹ නගර සංවර්ධන බල ප්‍රදේශය සඳහා වන සැලසුම් සහ ගොඩනැගිලි රෙගුලාසි 'ඇ' ආකෘතියේ සඳහන් මාර්ගෝපදේශ යටතේ යෝජිත මාර්ගයේ පළල මත නියමිත සංවර්ධනයන් සඳහා වන මහල් සංඛ්‍යාව තීරණය වන අතර, එහි අනුරූප මාර්ග ප්‍රවේශයට අවම වශයෙන් මීටර් 12 ක් (අඩි 40) පළල පාරක් හෝ විකල්ප සහ වෙනම ප්‍රවේශ මාර්ග 2ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පැවතිය හැකි අතර, අවශ්‍ය අනුමැතිය ප්‍රදානය කිරීම පිණිස අධිකාරිය වෙත පවරා ඇති ඒ අභිමතයට යටත්ව එක් එක් මාර්ගය අවම වශයෙන් මීටර් 6 ක පළලින් යුක්ත විය හැකි ය"

පාඨලී චම්පික රණවක,
මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2017 ජූලි මස 14 වැනි දින,

*සැ. යු. - මෙම රෙගුලාසිය 2017 ජූලි මස 14 වන දින සිට බලපැවැත්වේ.*

01 - 558

1A - PG 4350 — 92 (2019/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.